# වර්තමානයේ භාවිත නොවන කිරිල්ලවල ප්‍රදේශයේ වැවක් පිළිබඳව මූලික අධ්‍යයනයක්

**එම්.පී.එච්. පෙරේරා හා එච්.ඒ.එච්. මධුසංක**

සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.
piumipiumi.perera@gmail.com
harinda.madusankha@gmail.com

---

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිල්ලවල ප්‍රදේශයේ, වැබඩ නම් ග්‍රාමයේ පිහිටි වර්තමානයේ භාවිත නොවන වැවක් පිළිබඳව මූලික අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙහිලා යොදාගනු ලැබූ ක්‍රමවේදය වූයේ ලිඛිත මූලාශ්‍ර පරිශීලනය, ප්‍රදේශයේ මතුපිට ගවේෂණයක් සිදුකිරීම සහ ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ජනතාව සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ය. ග්‍රාමවාසී ජනතාවගේ අදහස වන්නේ වළගම්බා රජු දේශපාලන වියවුල් අවධියේ මායා රටේ විවිධ ස්ථානවල සැඟ වී සිටි අවස්ථාවේ යුද්ධයකට පෙර ආර්ථිකය ශක්තිමත් වීම අවශ්‍ය බැවින් මෙම ස්ථානයේ වැවක් සාදවා මායා රට සශ්‍රීක කළ බව ය. තව ද සාහිත්‍ය මූලාශ්‍ර අතරින් මයුර හා හංස සංදේශවල ද මෙම ප්‍රදේශයේ වැවක් පිහිටි බව කියැවේ.

මෙම ගවේෂණයේ දී අඩි 25 - 30 ක් පළලින් යුත් වැව් බැමි කොටසක සාධක සහ පිටවාන යැයි සැලකිය හැකි ස්වභාවික කපොල්ලක පිහිටීම හඳුනාගනු ලැබිණි. නමුත් වර්තමානය වන විට වැව ලෙස හඳුනාගත් ප්‍රදේශයේ දක්නට ලැබෙන්නේ කුඹුරුයායකි. ඊට හේතුව වන්නට ඇත්තේ බටහිර ආක්‍රමණ සමගම වැව ප්‍රතිසංස්කරණය කිරීමකින් තොරව ඒවා නොසලකා හැරීමය. නමුත් ලන්දේසි පාලන සමයේ සිතියම්වල මෙම පාලන ප්‍රදේශයේ වැවක් පිහිටි බව සටහන්ව තිබේ. ඒ අනුව මේ සාධක සියල්ල දෙස විමර්ශනාත්මකව බැලීමේදී නිගමනය කළ හැක්කේ වාරි තාක්ෂණයේ මුල් අවධියේ නිර්මාණය වූ පෞරාණික වැවක් මෙම ස්ථානයේ පිහිටා පැවති බව සහ තවදුරටත් පර්යේෂණ සිදුකිරීමෙන් වැව පිළිබඳව වැදගත් සාධක හෙළිකරගත හැකි වනු ඇති බවත් ය.

ප්‍රමුඛ පද : වැව, කිරිල්ලවල, මායා රට